**සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගම - 2018**

---------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරි සමාගමක සහය මා ලබා ගන්නා ලදි

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### කරුණු අවධාරණය

මාගේ මතය තවදුරටත් තත්ත්වාගණනය නොකරමින් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ පරිපාලිත සමාගමක් වන සිනො ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පෞද්ගලික) සමාගම එදිරිව සිදුකෙරෙන බේරුම් කිරීමෙහි ප්‍රතිඵලය සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාවය විස්තර කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 45.2 කෙරෙහි මම අවධානයට යොමුකරමි.

.

සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සමාගමේ පරිපාලිත සමාගම් වන සිනො ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පෞද්ගලික) සමාගම සහ හෙලන්කො හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පෞද්ගලික) සමාගම් හි අඛණ්ඩව පැවත්වා ගෙනයාමේ හැකියාව සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාවය විස්තර කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 49 ත් කෙරෙහි මම අවධානයට යොමුකරමි.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම සහ සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම සහ සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම සහ සමූහය  වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා  විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී  අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම සහ සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ.  කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගම සහ සමූහයේ  අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගම සහ සමූහය කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගම සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම සහ සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජුනි 04 දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන ලද නඩු තීන්දුවට අනුව, සමාගමේ කොටස් වැඩි ප්‍රමාණයක නෛතික අයිතිය ශ්‍රී ලංකා රජය වෙනුවෙන් තබා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරන ලදී. තවද එකී නඩු තීන්දුව අනුව, ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පී. එල්. සී. සමාගම මෙම සමාගමේ මව් සමාගම ලෙස පැවති කාලපරිච්ඡේදය තුලදී ඉපයූ ලාභ ගණනයකර, පෙර මව් සමාගමට ආරෝපිත ලාභ පියවන ලෙසත් භාණ්ඩාගාර ලේකම්ට නියෝග කරන ලදී. ඉහත කී ආරෝපිත ලාභ නිශ්චයවී නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | කාරණය තවමත් අදාල අධිකාරීන් සහ නීතිඥයන් සමඟ සාකච්ඡා කරමින් සිටී. එම නිසා අපි සාකච්ඡාව අවසන් වන තුරු මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ගැලපීමක් නොකරන තත්වයක සිටින්නෙමු. | උසාවි නියෝගයට අනුව ගෙවිය යුතු වටිනාකම ගණනය කිරීමට සහ නිරාකරණය කිරීමට පියවර ගතයුතු අතර අදාල ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකල යුතුය. |

### 1.5.2 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ සනාථ කිරීම් නොමැතිවීම හේතුකොටගෙන, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 16 හි හෙළිදරව්කර තිබුණු ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පී. එල්. සී. සමූහ සමාගමෙන් ලැබිය යුතු මුදල් ප්‍රමානයන් පිළිබඳ සම්පූර්ණත්වය, පැවැත්ම හා නිරවද්‍යතාවය සත්‍යාපනය කල නොහැකි විය. | අපි පෙර මව් සමාගම වන තිබුණු ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් පී. එල්. සී. සමාගමෙන් ලැබිය යුතු ලාභය ගණනය කිරීමට පවතින ලියකියවිලි රජයේ විගණකයන් විගණනය කරන අතරතුර ලබා දුන්නෙමු. තවදුරටත් අපි 2019 වර්ෂය අවසාන විගණනය වන විට අවශ්‍ය තහවුරු කිරීම් සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන්නෙමු. | අදාල තහවුරු කිරීම් ලබාගැනීමට කටයුතු කළයුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු වාරික | 3,508,806,544 | 3,367,744,986 | 141,061,558 | මෙය දීර්ඝ කාලීන නොසැසඳු ශේෂයක් වන අතර නොසැසඳු ශේෂ හඳුනාගැනීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. | නොසැසඳු ශේෂ සඳහා හේතු හඳුනාගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

2018 දෙසැම්බර් 31 වන දිනට සැසඳු වයස් විශ්ලේෂණය සහ ලෙජරයට අනුව ලැබිය යුතු වාරික අතර වෙනසක් වේ.

### 1.6.2 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිනත වන තෙක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර අගය කිරීම සහ විගණකයන්ගේ ගණනය කිරීම් අතර වෙනසක් තිබේ. මූල්‍ය වත්කම් අගය කිරීමේ රු.232,006,965 ක් වූ මෙම වෙනස පොලී ආදායමේ රු.27,390,390 ක වෙනසක් ඇති ක්රීමට හේතු විය. තවද ඉහත කී වෙනස මූල්‍ය | මෙම වෙනස්කම් සඳහා හේතුව වනුයේ SAP පද්ධතියට ශේෂ ඇතුලත් කිරීම සහ දශම ස්ථාන ආසන්න අගයට වැටයීමයි.2011 වර්ෂයේ දී SAP පද්ධතියට මූලික ශේෂ ඇතුලත් කිරීම් ආයෝජන දෙපාර්තමේන්තුවේ නොමැත. එම පිළිතුරම පසුගිය වර්ෂවල දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දී තිබේ. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ | මූල්‍ය වත්කම් නිවැරදිව අගය කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රකාශනවල මූල්‍ය වත්කම් සහ පොලී ආදායම අවතක්සේරු වීමට හේතු විය. | ආයෝජන කළඹ තුළ 2011 සැප්තැම්බර් වලට පෙර භාණ්ඩාගාර බැඳුම්කර සියල්ල එකවර ඇතුලත් කර ඇත. එම නිසා අදාල පැතුරුම්පත් අප සතුව නොමැත. | |

## 1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.7.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනට අවුරුදු දෙකට වඩා වැඩි රු.42,303,329 ක දීර්ඝ කාලීන හිඟ ගෙවිය යුතු ශේෂයක් තිබේ. එහි අවුරුදු දහයකට වඩා වැඩි රු.8,781,336 ක වඩුවෙකුට (Guy Carpenter) ගෙවිය යුතු ශේෂයක් පවතී. එයින් පසුව එම ප්‍රතිරක්ෂකයා සමඟ කිසිඳු ගනුදෙනුවක් සිදුකර නොමැත. | විස්තර සහිත විශ්ලේෂණයක් සිදු කරන අතර එක සිදුවීමෙන් සිදුවීම සැලකීමේ පදනම මත පසුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දීර්ඝ කාලීනව හිඟ ගෙවීමේ ශේෂ නිරාකරණය කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට රු.2,950,000 ක් ඇති දීර්ඝ කාලීනව ඉදිරිපත් නොවූ චෙක්පත් පවතී. | මෙය පද්ධතියේ ප්‍රශ්නයක් වන අතර අප වර්තමානයේදී SAP පද්ධති උපදේශකයන් සමඟ පද්ධතිය වැඩි දියුණු කිරීමට සාකච්ඡා කරන්නෙමු. | ශේෂයන් නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 5245 ලාභයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 4569 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 676 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ශුද්ධ ඉපයීම් වාරික, ආයෝජන ආදායම ඉහළ යාම සහ ශුද්ධ උපලබ්ධි ලාභය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාගමේ සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂ හතරක ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පහත සඳහන් වගුවේ දැක්වේ.

| වර්ෂය | **2018**<br>**රු. '000** | **2017**<br>**රු. '000** | **2016**<br>**රු. '000** | **2015**<br>**රු. '000** | **2014**<br>**රු. '000** |
|---|---|---|---|---|---|
| ආදායම | 44,379,869 | 39,399,737 | 42,107,760 | 31,156,767 | 29,301,980 |
| දල වාරික ආදායම | 31,737,894 | 31,437,682 | 27,614,433 | 24,520,012 | 20,655,987 |
| මෙහෙයුම් සහ පරිපාලන වියදම් | 8,822,546 | 7,484,404 | 6,446,601 | 4,975,705 | 5,999,863 |
| බදු පසු ශුද්ධ ලාභය | 5,244,795 | 4,569,150 | 12,741,317 | 3,439,357 | 3,257,013 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

මූලය ප්‍රකාශනවලට සහ විගණනයට සපයන තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ සමහර වැදගත් අනුපාත පහත දැක්වේ.

| **අනුපාත** | **2017** | **2018** |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1.29 | 1.21 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1.28 | 1.19 |
| දල ලාභ අනුපාතය | 93.15 | 103.47 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය | 3.28 | 3.83 |
| තෝලන අනුපාතය | 194.66 | 205.97 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාගම විසින් ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ සැලසුම කෙටුම්පත් කර ඇත. කෙසේ වුවත් කෙටුම්පත් අදියරේ සැලකිය යුතු කාලයක් පැවතියද ඉහළ | තොරතුරු සන්නිවේදන තාක්ෂණ ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාමේ සැලසුම දැනටමත් කෙටුම්පත් කොට ඇති අතර මණ්ඩලයේ අනුමැතිය ඇතිව | ව්‍යාපාරය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ සැලසුම සමාලෝචනය කිරීම, අනුමත කිරීම සහ සම්පූර්ණ කර නොමැත. |

| | |
|---|---|
| කලමනාකාරිත්වය විසින් සමාලෝචනය කිරීම, අනුමත කිරීම සහ සම්පූර්ණ කර නොමැත. | ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙන යාමේ සැලසුම පිළියෙල කිරීමට බලාපොරොත්තු වෙන් සිටී. |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) නො.06 සර් බාර්රෝන් ජයතිලක මාවත කොළඹ 01 ඇති ආයෝජන දේපල (අල්හම්බ්‍රා ගොඩනැගිල්ල) සඳහා වූ කල් බදු ගිවිසුම 2011 මැයි 18 දින කල්පිරි ඇති අතර සමාගම පසුව ගිවිසුම අළුත් කර නොමැත. | අපි කෙටුම්පත් ගිවිසුම සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලියේ යෙදී සිටී. තවද අපි අදාල රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා කරමින් සහ ඔවුන් සමඟ ලිපි ලේඛන සකසමින් සිටින්නෙමු. | ගිවිසුම විධිමත්ව, ලිඛිතව පවත්වා ගෙන යාමට සහ අළුත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| අ) කල්බදු ඉඩම- රත්නපුර හිස් ඉඩම | | |
| නො.29 දරන ගිවිසුම යටතේ 1999 ජුනි 21 දින සමාගම රත්නපුර පිහිටි ඉඩමක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹ ඇත. 2013 ඔක්තොම්බර් 14 දින ක්‍රියාත්මක වෙමින් පැවති ගිවිසුම, එකඟ විය නොහැකි කොන්දේසි හේතුවෙන් සමාගම අවලංගු කර ඇත. නමුත් සමාගමේ පොත්වල කල්බදු පදනම මත වූ ඉඩමක් ලෙස ඇතුලත් කර ඇත. | මෙම ඉඩම් නැවත රජයට ගෙන ඇත. පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සමාගමේ පොත්වල නිවරදි කිරීමට පියවර ගත යුතුය. |
| කල්බදු ඉඩම-මඩකලපුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන මඩකලපුව ඉඩම සඳහා 1991 මාර්තු 14 දින සමාගම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අවුරුදු 99 ක මෙහෙයුම් කල්බදු ගිවිසුමක් (නෙ.274) ඇති කර ගෙන තිබේ. එම ඉඩම දැනට නාගරික සංවර්ධන අධිකාරියේ භාරකාරිත්වය යටතේ පොදු රථගාලක් ලෙස පවතී. | | |

| | | |
|---|---|---|
| **කල්බදු ඉඩම-පුත්තලම ශාඛා කාර්යාලය**<br>ඉහත කල්බදු ඉඩම සඳහා වු කල්බදු ගිවිසුම කල්බදු කාලය සම්පූර්ණ වීම මත අවලංගු වී ඇති අතර සමාගම කල්බදු ගිවිසුම දීර්ඝ කර නොමත. එසේ තිබියදීත් ශාඛාව තවමත් එම ඉඩමෙහි පවත්වාගෙන යනු ලැබේ. | රජය සමඟ කල්බදු ගිවිසුම දීර්ඝ කිරීමට සන්නිවේදනය කරමින් සිටී. | කල්බදු ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කල යුතුය. |